# හෙළ අවුරුදු වග




දින $\frac{92}{23\ ½}$ x 6 = දින 23 ½

මාරතු 21+ දින 23 ½

අප්රේල් 13 පස්වරු

# හෙළ අවුරුදු වග

අරිසෙන් අහුබුදු

කතුවර පළ කැරුමෙකි

හෙළ අවුරුදු වග

අරිසෙන් අහුබුදු

පළමු පැහැරැවුම - 2549 බක්/2006 අප්‍රේල්

ISBN-955-1404-02-4

පිරිගිණුම් අකුරු සැකැසුම
" මයිල්ඩ් ක්‍රියේෂන්ස් "
(ප්‍රියන්ත පතිරත්න 077 3560955)

වසුන් පිටු සැකැසුම
රෙක්ස් හැමිල්ටන් පුරනඳු

පැහැරැවුම
බොරලැස්ගමුවේ
රත්තණපිටියේ
"පොලයිට්" මුද්‍රණාලයය
011 2518697

පොලයිට් මුද්‍රණාලයය
109/1A, පාසල් මාවත, රත්තණපිටිය, බොරලැස්ගමුව.
ටෙලි. 011 2518697

# පෙරවදන

සිංහළ අවුරුද්ද සිංහළයන් ගේ මහ මැ උලෙළ යි. වසරකට වරක් එළැඹෙන මේ උලෙළ 'දොළොස් මාසෙකට යන දවස' යි සිංහළයෝ හඳුන්වති. සිංහළයන් ගේ ඉපැරැණියාවත් වෙසෙසියාවත් මැනැවින් දක්වාලන මෙ වන් වෙනත් දිනයෙක් නැති. එ මැ කරුණු පහයාලමින් අප විසින් බොහෝ කලෙකැ සිටැ පුවත් පත්, සගනු ආදියට සැපැයුණු ලිපි සිය ගණනෙකි. රෙදෙවුව, තලදසුන ආදියෙන් ද නොඑක් විටැ කරුණු දැක්වූමු. එහෙත් ඒවා කියැවූ මතින්, ඇසු-දුටු මතින් වියැකියන අයුරු දුටු වෙදැදුරු ජයනාත් අබේවික්‍රම කලණ සබඳාණෝ සිංහළ අවුරුද්ද පිළිබඳ අප මෙ තෙක් දක්වා ඇති සියලු කරුණු පොත් ගැන්වීම මැනැවැ යි අප ඇරියූ හ: ඒ සඳහා සියලු එ බරපන දරන්නට ද ගිවිසිය හ. එහි පල විසින් මෙසේ 'හෙළ අවුරුදු වග' එළි දකී.

සිංහළ අවුරුද්ද දෝ සතර (ජ්‍යොතිෂය) හා බෙහෙවින් බැඳී පවති. අවුරුද්දෙහි හැම කිසක් මැ කැරෙනුයේ නකතට අනුව යි. එ හෙයින්, ආදි හෙළයන් ලොවට දුන් දොළොස් රැස් (රාසි දොළොසෙහි) නම් වැළ ද සත් විසි නකත් නම් වැළ ද උපැඳි ලෙසින් මෙ ගත අගට එක් කැරිණ. එ මෙන් මැ, දොළොස් මස් නම් වැළ ද උපැඳියක් ලෙස යෙදී ඇති.

සිංහළ අවුරුදු යටගියාව ගැනැ ද පොදුවේ හෙළ යටගියාව ගැනැ ද විමැසුම් නුවණින් අප මතු කළ කරුණු බොහෝ දෙනකු ගේ පිළිගැන්මට ලක් වැ ඇති අයුරු සොම්නස් දනවයි. නොබෝ දා, තලදසුන් (රූපවාහිනී) වැඩ සටහනෙකැ දී එක් වියත් කෙනකුන් අවුරුද්ද ගැන අප දැක්වූ නවමු කරුණු පවසනු අසන්නට ලැබිණි. කවරකු අතින් හෝ වේ වා, නිවැරැදි හැඟුම් රටට යේ නම් අපට එ මැ පමණි.

මෙ ගත ලියන්නට ඇරියුම් කොට, මෙහි සියලු බරපන ද දැරූ වෙදැදුරු ජයනාත් අබේවික්‍රමයනට ද මෙහි ලා නන් අතින් උදවු දුන් ශ්‍රීනාත් ගණේවත්තයනට ද වසුන් පිටුව සැකැසූ රෙක්ස් හැමිල්ටන් පුරනඳුවනට ද අප ගේ පින හිමි වේ.

අරිසෙන් අහුබුදු

2549 බක් පුර 15

2006 අප්‍රේල් 13

## මෙ ගත්කරු ගේ අලුත් පොත්

සිරි දෙසුම

සිරි සසුන

පන්හිඳ හි සර

සියපත

නුතන ජාතක

රස දහර (තෙ වන සැකැස්ම)

එන කපේ බණ කතා

හෙළ දෙරණ වග

රාවන හිනාව (ළමා)

සෙත් සයුර

## පළ වන්නට ඇති පොත්

සතර සිවටන (පෙරැළිය)

උතුරු නැගෙනහිරි ළංකා ගම් නම් වග

හෙළ සඳ පෙහෙළිය


මනු වස

රන් රසු ගී සර

සැරය (නව සැකැස්ම)

# පෙළ ගැස්ම


| | | පිටුව |
|---|---|---|
| 1. | ඇරියුම | 9 |
| 2. | The Sinhala New Year | 13 |
| 3. | අවුරුදු අරුත | 15 |
| 4. | අවුරුදු වෙසෙසියාව | 16 |
| 5. | අවුරුදු යටගියාව | 18 |
| 6. | අවුරුද්දෙන් කැරෙන කල් මිනුම | 21 |
| 7. | අවුරුද්ද හා සබැඳි සොබා දහම | 24 |
| 8. | අවුරුදු නකත් | 26 |
| 9. | අවුරුදු කෑම බීම | 27 |
| 10. | අවුරුදු කෙළි සෙල්ලම් | 28 |
| 11. | සිංහළ අවුරුද්ද | 29 |
| 12. | අවුරුදු ඇගැයුම | 30 |
| 13. | දොළොස් මස් නම් වැළ | 33 |
| 14. | දොළොස් රැස් නම් වැළ | 37 |
| 15. | සත් විසි නකත් නම් වැළ | 41 |


අවුරුදු
හිරු

# ඇරියුම

''ලක්දිව නම ද දී ලංකා දිවයිනට
ලක් කොටැ මෙ දිව හෙළ අවුරුදු ගියෙ ලොවට
ඔක්කොම පුවත් පත් පළ කළ මුත් කුමට
එක් පොතෙකින් වුව ද ඒ පවති දිගට''

මේ ඇරියුමෙන් මා ඇරියූ මිතුරුවර
හා, ඔබ පුවත් හඳුනාගැනුම යැ පවර
ඒ ඔහු විතර සැකෙවින් දක්වන මෙ යුර
පිරිසි දියෙන් පෑවෙකි සමුදුර ගැඹර

පන්සිය පනස් වන වසැ දෙ දහසින් බුදු
දුන්නෙ යැ රුවන්වැලි සෑ සුනු පිරියමුදු
ඉන් නො නැවැති දිගටැ මැ සෑ කරන සුදු
සංසදය ද හෙ ඇරැඹී හුදු බැතිනි බුදු

දෙ තුන් මසක් යන සෑ සුනු පිරියමට
පොසොන් මස ගෙවෙන තුරු සම්මාදමට
ගණන් බලනවුන් හට ඉඟියක් ලෙසට
මැදින් එක් මසින් සෑ රැඳැවී සුදට

සුනු පිරියමට පෙරටු වැ කළ යුතු සේ ම
නිම විණි දෙ සතියෙන් සෑ රදු සිරිම
එ සමඟ වැහි දෙවිඳු සිදු කෙළෙ සේදීම
දෙවියන් බෙලෙන් මසෙකින් නිම් හුනු ගෑම

මහ සෑ නමින් දිගට මැ ගෙනැ ගිය එ ලෙස
බොරු සම්මාදමට මතු ඉඩ නොවන ලෙස
'මහ බරකරු' දු අස්වා නීතියේ බස
නිහඬ කෙළෙ හෙ තෙම පෑ යුක්තියේ ගොස

අයුක්තියට එරෙහි වැ හෙණ සේ නැහෙන
යුක්ති බිමැ 'ඉඳුරු කීලය' මෙන් සිටින
මේ නම් 'දම්පසක්නාවෙකි' පොරණ දින
කාලය බලා යළි ආ දෝ හොයි සිතෙන

පුලත් රුසිඳු පළ කළ වෙද රුසි දැනුම
බුජස් නිරිඳු ගෙන් ඔප් වී යළි මෙ බිම
සැපත් වූ විලස් පෑ වෙදකමින් තම
විදෙස්හිත් යසස් රැඳැවූවෙකි මෙ තෙම

රන්වැලි සෑයැ සුනුවම නිමි දවස සෙට
වන්නෙ යැ මැදින් මස දහඅට වැනි දිනට
අසූ ස-වැනි වස මා ඉපැදුණු දිනට
එ දින මැ යෙදුණු සැටි මහ පුදුමයෙකි මට!

පුදුමය තව මහත් කොට එ දිනැ මැ උදයේ
ඔසුමය කැඳක් ගෙනැ මා ලන දිගු දිවියේ
ඔහු මැ පැමිණි සැටි දැකැ තොස උඩට ගියේ
මහ මෙර වුව ද ම-තොසට වැනි මිටි වැ ගියේ

''ආයුබොවන්, සුරුවෙනි, ඔබ උපන් දින
ආසිරි සමඟ ආවෙමි ඇරියුමක් ගෙන
මේ එන සිහළ අවුරුදු වග පොතක් මෙන
ජාතිය සතු කරමු; මගෙනුයි එ බරපන

පළ කරවනු පිණිසැ 'අවුරුදු වග' එ පොත
පහරු මිල මගෙනි, ලහි කළ යුතු යැ තැත''
**අබාවිකුම් ජයනාත්** වෙද තිළිණ අත
ලබා එළි දකී 'අවුරුදු වග' මෙ පොත

පොතක් ලියනු වස් ලෝ වැඩ පිණිසැ වන
අතක් දෙන අතත් අත් දහසක් වටින
පුතෙක් එ වන් වෙද? ඔහු හට උපත දෙන
මවත් නිවුණී යැ, ඒ පියාට ද නිවන!

අවුරුදු උදාවෙන් ලොවට මැ 'දින දසුන'
ඔවි අපි දුනුමු මෙ බසින් විබෙදා ගුවන
මවු බස සිංහළේ වත් රජ බස කරන
එවු ! එවු ! නැඟෙවු! හෙළයෙනි පැ හෙළ'බිමන

**අරිසෙන් අහුබුදු**

# The Sinhala New Year

The Sinhala New Year is an event that has gone to the world from the land of the Sinhalese (Lanka). The land of the Sinhalese or the land of the Helese or Helanka or Lanka is situated between $5^0$ and $10^0$ North Latitude.

The Sun which is overhead at the Equator on 21st March proceeds on its journey of 23 ½° Latitude towards the Tropic of Cancer at whch it is overhead on 21st June. It is overhead at Walasgala Koggala in Lanka (6° N.Latitude) on 13th and 14th April commencing a new round on its orbit.

It is this day which has given to the world both Astrology and the Calendar, that we call Sinhala New Year's day.

It is stated that the coronation of Maha Sammata Manu of Manunuwara (Mannar) considered to be the first king not only of the Sinhalese but also of the entire human kind took place at the auspicious time of the New Year.

It is stated in our history that king Gemunu on his way to wipe out the enemies from the North, took part in New Year festivities (Nekat keli) and that Vijayabahu I (Keerti) held 73 such festivities.

It was in 1865 that the Sinhala New Year's day was declared a holiday in Lanka by the British Government along with the Wesak day. This was named as Sinhala-Hindu New Year by the British to give some recognition to the Ponnambalam Ramanathan faction too.

This was referred to as the Sinhala-Tamil New Year in the Calendar in 1984 by the J.R. Jayawardena Government.

But this day is not observed in North India as a Hindu New Year or as a Tamil New Year in South India (Tamilnadu)

This Sinhala New Year's day which gave both the Sun Calendar and Astrology to the world is the most important day of the year that should be declared the World Day.

# හෙළ අවුරුදු වග

## අවුරුදු අරුත

අවුරුදු යන වදන පාලියේ සංවච්ජර (සකු සංවත්සර) යන්නෙන් නිපන් සේ පුවසුරු විල්හෙල්ම් ගයිගර ඈ වියත්හු දක්වත්[1]. මෙහි දී ඔවුන් පිහිට කොටගන්නා නියර වනුයේ "සිංහල වදන් සියල්ලයටතේ පිරිසෙයින් ඉතා වැඩි කොටස - සකු පාලි දෙ බසින් බිඳී එති යි යන මතය යි. මේ මතය මැ සපුරා වැරැදි යැ. එහෙත් මෙය පිළි ගන්නෝ මැ පවා සංවච්ජර යන්නෙන් අවුරුදු යනු නිපැත්ම කෙරෙහි සැක පහළ කෙරෙති.[2]

අවුරුදු යන්නෙහි සැබෑ අරුත නම් වෙසෙසි දවස යනු යි. 'වර' යනු සිංහළයෙහි දවසට නමෙකි. වහ යන්න මැ වහතු, බර මැ බරතු (බුරුතු) වන්නා සේ සියරුත් නම්දුනු (ස්වාර්ථ තද්ධිතා 'ත' පස ( ප්‍රත්‍යයය) එයට එක් වැ 'වරතු' වෙයි. පසු සර සැමැයිමෙන් (පරස්වර සාම්‍යයෙන්) 'වරුතු' වෙයි. වෙසෙසි අරුත්හි 'අ' උපසග (උපසර්ගය) එක් වීමෙන් ඒ 'අවුරුතු' වෙයි. අගොසකුරක් (මෙහි 'ත්') වෙනුවට ගොසකුරක් ('ද්') අදෙස් වීමෙන් (ඝෝෂාදේශයෙන්) 'අවුරුතු' යනු මැ 'අවුරුදු' වෙයි. මේ අරුත්හුරු නිපැදියාව අද පිළිගැනීමට ලක් වැ ඇති[3]. සිංහළයෙහි 'අ' - 'හ' මාරුව සිදු වන බැවින් 'හවුරුදු' යනු ද යෙදේ.

---

1. Wilhelm Geiger, An Etymological Glossary of Sinha lese Language, P. 13
2. **සිංහල ශබ්ද කෝෂය,** 21 වන භාගය, 1048 වන පිටුව.
3. **සිංහල හින්දු අලුත් අවුරුද්දේ සමාජ විද්‍යාත්මක පදනම,** එන්. වී.පී.ඒ. හේමන්ත කුමාර, දිවයින(ඉරිදා සංග්‍රහය), 2005 අප්‍රේල් 10

# අවුරුදු වෙසෙසියාව

අවුරුදු නම් වෙසෙසි (විශේෂ) දවස බව යට කියැවිණි. එමැ වෙසෙසියාව (විශේෂත්වය) කිමෙක් ද? මෙය පැහැදිලි කැරගැන්මට මඳක් යටගියාව දෙස බැලිය යුතු යි.

ඉපැරැණි හෙළ යටගියාව පිරික්සත පැහැදිලි වැ පෙනෙන කරුණෙක් නම් ආදි හෙළයන් අතර හිරු ඇදැහිය (සූර්ය වන්දනාව) පැවැති බව යි. සිංහළයන් ගේ හෙවත් සිවුහෙළයන් ගේ එක් වගක් වූ අසුර හෙළයන් ලොවැ නොඑක් දෙස්හි දනවු (ජනපද) පිහිටැවීමේ දී මේ හිරු ඇදැහිය ද ඔවුන් අතින් ලොවට මැ ගිය බවට යට ගියාව දෙස් දක්වයි. දඹදිවට ද මිසරයට ද හිරු ඇදැහිය පැතිරැ -ගියේ මේ අයුරිනි. මිසරයේ හිරු මුල් කොටැගත් හැදියාව ලොවැ ඉපැරැණි මැ හැදියාවක් ලෙස ගැනේ[4].

ගොවිකම (කෘෂි කර්මාන්තය) ලොවට දුන් අසුර හෙළයන් එ කමෙහි පදනම වන හිරු ඇදැහුවන් වීම, හිරු මුල් කොටගෙනැ සිතුවන් වීම පුදුමයක් නො වෙයි[5]. එ සේ තමන් ගේ බුහුමනට ලක් වන, තම දිවි පැවැත්මට වෙසෙසින් උදවු වන හිරු ගේ ගමන මුල් කොටැගෙනැ එ මැ පැරැණි හෙළයෝ අවුරුදු උදාව යොදාගත් හ.

වත්මන් දින ගණන් අනුව, මාරතු 21 වැනි දා සමකයට මුඳුන් වන හිරු උතුරු අතට යන ගමනේ දී අංසක 23 1/2ක් උතුරින් පිහිටි -කටක නැවැත්මට- කර්කටක නිවර්තනයට මුඳුන් වන්නේ ජුනි 21 වැනි දා යැ. එ විට මේ ගමනට යන දින ගණන 92කි. අංසක 23 1/2ක් යෑමට දින 92ක් ගත වන්නේ නම් අංසකයක් යෑමට ගත වන කාලය (දළ විසින්) දින 3.9කි.

---

4. සිංහල මහිමය, 68-69 පිටු
5. අස්(අස්වැන්න) කුරු(කරන්නා) යන දෙ පදය එක් වැ (අස්+කුරු) අසුර යනු නිපැදේ. වැඩි විතර සඳහා අප විසින් ලියැවුණු 'හෙළ දෙරණ වගෙහි' 29, 35 පිටු බලන්නැ.

ළංකාව පිහිටා ඇත්තේ උතුරු අංසක (උත්තර අක්ෂාංශ) 5ත් 10ත් අතරේ යැ. ඉපැරැණි රජදහනක් වූ කොග්ගලැ, වළස්ගල[6] ඇත්තේ හරියට මැ අංසක 6 සලකුණු වන තන්හි යැ. හිරු අංසකයක් යැමට දින 3.9ක් ගන්නේ නම් අංසක 6ක් යැමට (දළ විසින්) දින 23.46ක් ගනි. එ නම් දින 23 1/2කි. මාර්තු 21 වන දින සිට ඉදිරියට දින 23 1/2ක් ගණන් කළ කල්හි එනුයේ අප්‍රේල් 13 වැනි දින සවස යි. අවුරුදු උදාව ලෙස සිංහළයන් සලකනුයේ මේ වෙසෙසි දවස යි.

මේ වෙසෙසි දවසෙහි සිදු වන අනෙක් වැදැගත් කරුණ නම් දොළොස් රැසෙහි (රාසි දොළොසෙහි) මුලැ මැ වන එළු හෙවත් 'මේෂ' රාසිය වෙත හිරු පැමිණීම යි.

සක්වළ වටය අංසක 360ක් කොටැගත් ආදි හෙළයෝ එය අංසක 30 බැගින් වූ දොළොස් රැසකට බෙදා, අවුරුදු දා සිය රට - හෙළු දිව - මුඳුනින් ඇරැඹෙන මුල් රැස රටේ නමින් මැ හෙළු යැ යි ගත් හ. හෙළු මැ එළු වෙයි. 'එළු' යන්නෙහි තිරිසන් අරුත පමණක් දුටු දඹදිව් ඇදුරෝ එය 'මේෂ' යැ යි සකු බසට (සංස්කෘතයට) හරවාගත් හ[7]. (දොළොස් රැස් නම් වැළ බලන්න.) අවුරුදු දා හෙවත් අප්‍රේල් 13 වන දා, හිරු, අවසන් රැස වන මින් (මීන) රාසියේ සිට මුල් රැස වන එළු (මේෂ) රාසියට පැමිණෙයි.

---

6. වළස්ගල යන්න වලස්ගල යැ යි ඇතැමුන් ලියන්නේ තිරිසන් සතකු වන වලසාත් එයත් අතර සබැඳියාවක් දකිමිනි. එහෙත් වදනෙහි නිරුත එයට හරස් වැ යෙයි. වා+අළ+අස්+ගල>වළස්ගල වෙයි. මෙහි වා නම් අවුරුද්ද යි. වස්>වහ>වා වෙයි(පස්වාන් දහසකට....ඈ යෙදුම් විමසන්නැ) අළ නම් එළැවූ (ඉදිරිපත් කළ) යනු යි. අස් නම් අංසකය යි. එ විටැ වළස්ගල නම් 'අවුරුද්ද ඉදිරිපත් කළ අංසකය' එල්ලේ ඇති තැන යි. සිංහළ අවුරුදු උදාව වළස්ගල මතින් වන බැවින් එ තැනට ලැබුණු නමෙකි මේ.
7. දෝ සතර (ජ්‍යෝතිෂය) ලොවට දුන්නේ ආදි හෙළයන් මැ බව මැනැවින් තිර කරන කරුණෙකි දොළොස් රැස්හි නම් වැළ. එ මැ ආදි හෙළයන් දොළොස් රැස මැ නම් කැරැ ඇත්තේ ඉතා අරුත්හුරු ලෙස බව මෙහි දෙ වන උපැඳියේ දැක්වෙන නම් වැළ විමැසුම් නුවණින් යුතු වැ බැලීමෙන් වැටැහෙනු ඇති. එහෙත් වදනෙහි රුව පමණක් බලා සකු බසට හරවා ගැනුණු එ නම්වලැ දෝ සතර හා සබැඳි අරුතෙක් නැති.

සක්වළ වටය දොළොස් රැසකට බෙදුවා සේ ම, ආදි හෙළයෝ එය නකත් සත් විස්සකට ද බෙදූ හ. මේ අතරින් හිරු මුඳුන් වී සිටි නැකැතින් අවුරුද්ද ඇරැඹේ. අංසක හෙවත් අස් විදහන (පෙරට යවන) හෙයින් මේ නකත අස්විද වෙයි. දඹදිවැ ඇදුරන් 'අශ්විනී' යැ යි සකු බසට නඟාගත්තේ මේ හෙළ වදන යි[8]. (නකත් නම් වැළ බලන්න.)

'දොළොස් මාසෙකට යන දවස' යන්න අද ද අවුරුදු සඳහා ගැමි වහරේ එයි. මෙයිනුදු පෙනෙනුයේ අවුරුදු යන්නෙහි වෙසෙසි දවස යන අරුත ඇති බව යි.

# අවුරුදු යටගියාව

අවුරුදු යටගියාව යටත් පිරිසෙයින්, මහා සම්මත මනු නිරිඳු යුගය තෙක් දිවෙයි. හැඳුණු ලොවෙහි මුල් මැ රජු ලෙස සැලැකියැ හැකි එ මැ මනු නිරිඳු රජ බවෙහි අබිසෙස් ලදුයේ හෙළ අවුරුදු දිනයෙකැ යි. ඒ කිතු වසින් පෙරැ 28200 වැන්නේ දී යි. හෙළ දිවට හිරු මුඳුන් වන දිනය එ කලැ ද වෙසෙසි උලෙළු දිනයක් වූවාට සැක නැති.

---

8. දොළොස් රැස් නම් වැළ සේ මැ සත් විසි නකත් නම් වැළ ද ලොවට ගියේ හෙළ බසිනි. එ මැ නම් විබෙදා (විග්‍රහ කැරැ) බැලීමේ දී දෝ සතරට අදාළ වැ හෙළ බසින් අරුත් දැක්වියැ හැකි යි. එහෙත් සකුවට නඟාගත් නම්වලැ එ බඳු අරුත්හුරු බවෙක් නැති. තෙ වන උපැඞියේ දැක්වෙන සත් විසි නකත් නම් වැළ විමසා බැලීමෙන් එ බව වැටැහෙනු ඇති.

අපේ පැරැණි පොත්හි 'නකත් කෙළි' නමින් දැක්වෙනුයේ අවුරුදු උලෙළ ද යනු විමැසියැ යුතු වෙයි.[9] අවුරුදු උලෙළෙහි සිරිත් විරිත් ද නකත මුල් කොටැ පවති. පඬුඅබා (පණ්ඩුකාභය) රජු මයිල් යුද දිනා රජයට පත් පසු සහපිරිවරින් නකත් කෙළියෙහි යෙදුණු බව සඳහන් වෙයි.[10] කිත් විජේබා (කීර්ති විජයබාහු) හෙවත් මහ විජයබා රජු ද නකත් කෙළි හැත්තෑ තුනක් පැවැත්වූ බව පොත්පත්හි එන කරුණෙකි.

ඉන් මැතැ, මහනුවර කලැ දී ද සිංහළයන් අවුරුදු උලෙළ ඉහළින් මැ පැවැත්වූ බවට දෙස් ලැබේ. ජෝන් ඩේවි නම් ඉංගිරීසි වෙදැදුරා මෙ රට ගැන ලියූ පොතෙහි සිංහල අවුරුදු උලෙළ පිළිබඳ වැදගත් තොරතුරු රැසෙක් ඇති. මහනුවරැ, වසරක් පාසා මහ උලෙළු සතරක් පැවැත්වුණ හ යි ද ඉන් පළමු වැන්න 'අවුරුදු මංගල්ලේ' නමින් හැඳින්වුණ අලුත් අවුරුද්ද යැ යි ද හේ පවසයි.

ඩේවි දක්වන සැටියට මෙ උලෙළ, මුළුමනින් මැ රජයෙහි පිටුබලයෙන් කැරුණෙකි. අවුරුද්ද එළඹීමට පෙරැ, රජ මැඳුරේ වෙද්දු වන ඔසු යොදා කුඩා මුට්ටි දහයක් පිළියෙළ කළ හ. මේ හිසැ තෙල් ගෑම පිණිස යැ යි සිතියැ හැකි. එ මෙන් මැ රජු ගේ නකත් ඇදුරෝ නකත් වට්ටෝරුවක් පිළියෙළ කළ හ.

පරණ අවුරුද්ද සඳහා කැරෙන දිය නෑම ද මෙ කලැ නකතට මැ කැරුණු බව එ සඳහා ද නකතක් පිළියෙළ කිරීමෙන් පෙනේ.

අවුරුද්ද ලබන නකත් මොහොතේ දී රජ තෙමේ නිලමෙවරුන් විසින් පිරිවරන ලදුව ඉතා විසිතුරු ලෙස සැරැසි සිහසුන් අරා සිටියේ යැ. එ මැ නකත් මොහොත කොඩිතුවක්කු හඬ මඟින් මහජනයා හට දැන්විණ.

---

9. මහ වස (මහාවංසය) වැනි යටගියා පොත්හි සේ මැ සදහම් රුවන් වැළ(සද්ධර්ම රත්නාවලිය), ජාතක පොත ආදියෙහි ද නකත් කෙළිය ගැනැ සඳහන් වෙයි. මෙය හිරු-සඳු ඈ ගහයන් ගේ ගමන අනුව යෙදෙන නකත් වේලා බලා පැවැත්වෙන උලෙළක් සේ ඇතැම් වියත්තු දක්වත් (සිංහල ශබ්ද කෝෂය, 32 වන භාගය, 5863 වන පිටුව). අප ගේ හැඟුම නම් මේ සිංහළ අවුරුදු උලෙළ මැ වියැ යුතු බව යි.

10. මහාවංසය, 10 වන පිරිසිඳිය

අහර බිදීම ද රජු හා නිලමෙවරුන් හා විසින් නකතට මැ සිදු. කැරිණි. 'දිනබෝජම' නම් වෙසෙසි අහරක් එ සඳහා පිළියෙළ කැරිණැ යි සඳහනි. අලුත් අවුරුදු ඇරැඹුම් නකත හා මෙ නකත හා අතරැ කලැ දී ගින්නෙන් අහර පිසීම ද එ සේ පිසුණු අහර බිදීම ද තහනම් බව වෙසෙසින් සඳහනි. වෙළෙඳාම් කටයුතු ද, ගනුදෙනු ද මෙ නැකැතින් මැ කරනු ලැබිණ මහජනයාද, එකිනෙකාට තෑගි පිරිනමාගත් බව සඳහන් යැ.

ඔසු හා සුවඳ තෙල් හා හිසැ ගා දිය නෑම නාත දෙවොල් බිමේ දී නකතට සිදු කැරිණි.

ඩේවි සඳහන වෙසෙසි කරුණෙක් නම් මුළු අවුරුදු කල මැ රටවැසියාට රාජකාරියෙන් නිදහස ලැබුණු බවයි. එ හෙයින් උසස් නිලදරුවනට සේ මැ ඔවුනට ද ඉසුඹු සුවෙන්, සොම්නසින් අවුරුදු සමය ගෙවිය හැකි වී. එ කලැ ද සිංහළ අවුරුද්ද මුළු දෑය මැ එකට බැඳැලන උලෙළක් වූ වග මෙයින් පෙනේ[11]

කලක් මැ දෙවන රාජසිංහ රජු ගේ සිරකරුවකු වැ සිටි රොබට් නොක්ස් නම් ඉංගිරිසියා, ලක්දිවෙහි සිය අත්දැකුම් අලළා ලියූ පොතෙහි දු එ කලැ අවුරුදු උලෙළ පැවැත්වූ හැටි සඳහන් වෙයි.[12]

---

11. An Account of the Interior of Ceylon and of its Inhabitants with Travels in that Island (සිංහළ පෙරැළිය: **ඩේවි දුටු ලංකාව,** 159-161 පිටු)
12. සිංහළ අවුරුද්ද උදා වන්නේ මාරතු 27 වන දා හෝ 28 වන දා හෝ යැ යි ද කලාතුරෙකින් 29 වන දා වියැ හැකි යැ යි ද නොක්ස් පවසයි. හිරු ගමන අනුව අවුරුදු උදාව තබාගනු පිණිස එ සේ කැරෙති යි ද හේ පවසයි (An Historical Relation of Ceylon, 177 වන පිටුව). එහෙත් සිංහළයන් ගේ අලුත් අවුරුදු උදාව හැම විටැ මැ යෙදුණේ අප්රේල් මසැ දී බව ඩේවි තිර වැ මැ පවසයි (ඩේවි දුටු ලංකාව, 160 වන පිටුව).

# අවුරුද්දෙන් කැරෙන කල් මිනුම
# (කාල මානය)

අවුරුදු යන වදනෙහි නිරුත යට දැක්විණි. එ අනුවැ, එක් වෙසෙසි දිනයෙක් අවුරුදු දිනය වෙයි. එ සේ මැ, එ වෙසෙසි දිනයෙහි සිටැ ඊ ළඟට එළැඹෙන එ බඳු මැ, වෙසෙසි දිනය තෙක් කල් පිරිසිඳිය ද සිංහළයෝ අවුරුදු නමින් මැ ගත් හ. කෙටියෙන් කියතොත්, හෙළදිව කෙලින් ඇති හෙළු (එළු) රැසින් ගමන් අරඹන හිරු,[13] දොළොස් රැස මැ ගෙවා යළි හෙළු රැසට පැමිණීම තෙක් කල් පිරිසිඳිය (කාල පරිච්ඡේදය) අවුරුද්දෙකි. දවස් විසින් නම් තුන්සිය සැට පසෙකි.

හිරු ඇදැහිය ලොවට ගියේ හෙළ දිවිනි.[14] හැඳුණු ලොවෙහි මුල් මැ රජු ද මුල් මැ හෙළ රජු ද වූ මනු රජ තෙමේ, සිවු හෙළ වගෙහි අසුර වගට අයත් වුවෙකි. අසුර යනු නිපන්නේ 'අස්' + 'කුරැ' යන දෙ වදනිනි. අස්වැන්න කරන්නා යනු එහි අරුත යි. ආදි මැ හෙළ වග වූ මේ අසුරයන් ගොවීන් වූ බව එයින් පැහැදිලි යි. හිරු ගමන ගොවිතැනට බෙහෙවින් මැ බලපානුයෙන් එ මැ ආදි හෙළයන් හිරු අදහන්නන් වීම ඉතා සොබාහුරු (ස්වාභාවික) යි. එ හෙයින් හිරු ගමන මුල් කැරැගෙන දවස් තුන්සිය හැට පහේ අවුරුද්ද ලොවට දෙන ලදුයේ හෙළයන් විසින් මැ බව ඉතා පැහැදිලි කරුණෙකි. දොළොස් රැසත්, සත් විසි නකතත් ආදි හෙළයන් විසින් මැ නම් කරනු ලැබැ තිබීම මෙ බව තව දුරටත් තහවුරු කරයි (දොළොස් රැස් නම් වැළ හා සත් විසි නකත් නම් වැළ හා බලන්නැ).

හිරු ගමන අනුවැ කාලය මිනීම මිසර සැබියාවට අයත් වුවක් සේ ඇතැම්හු සලකති. එය මිසරයෙන් පලස්තිනයට ද එ තැනින් ගරසියට (ග්‍රීසියට) ද පැතිරුගිය සේ සිතනු ලැබේ. එහෙත් ඇත්ත නම් මෙය හෙළ දිවින් ලොවට මැ ගිය බව යි. මිසරයෙහි

---

13. මෙහි 7-8 පිටු බලන්න.
14. මෙ ගැනැ වැඩි විස්තර සඳහා **'සැරය'** සැකැස්මෙහි (බු.ව. 2496 උණවටුනේ හේළි පහරුව) එන වෙල්ලාල ජයමහයන් ගේ පෙරවදන ද **'හෙළ දෙරණ වගේ'** (අරිසෙන් අහුබුදු, ස්ටැම්පර්ඩ් ලේක්, පන්නිපිටිය, 2005) 19-23 පිටු ද බලන්න.

දනවු පිහිටුවන ලදුයේ, එ රට ජනාවාස කරන ලදුයේ, හෙළයන් විසින් මැ බව එහි හැඳියාව 'හෙළනිස්ටික්' (Helanistic) යැ යි හැඳින්වීමෙන් මැ පෙනේ. එ රට රජ පෙළපත හඳුන්වන 'පාරාවෝ' යනු ද හෙළ බසින් ගිය නමෙකි. කොටින් මැ මිසර යන්න මැ හෙළ වදනෙකි (මිහි + සර > මිසර > මිසර).[15] මෙ සේ, මිසරය ජනාවාස කරන ලද්දේ අසුර හෙළයන් විසිනි. මිසරයට හිරු ඇදැහිය ගියේ ඔවුන් මඟින් මැ බව පැහැදිලි යි. හිරු ගමන මුල් කොටැ කාලය මනින පිළිවෙළ ද ඔවුන් විසින් මැ එහි ගෙන යන ලද හ යි සිතියැ හැකි.

මෙ සේ, හිරු ගමන අනුවැ දවස් තුන් සිය හැට පසෙකැ අවුරුද්දක් ලොවට ගියේ හෙළ දිවින් බව පැහැදිලි යි.

අවුරුද්දෙකැ කල් පිරිසිඳිය හඳුන්වනුව යෙදෙන අනෙක් වදන නම් 'වස්' යනු යි. මෙ ද නිපන් හෙළ වදනෙකි. 'වා' නම් ඉසිලීම යි. 'අස්' නම් අස් වීම යි, ඉවත් වීම යි. අස් වීම - ඉවත් වීම උසුලනුයෙන් වා+අස් > වස් වෙයි. පාලියෙහි 'වස්ස' යනු ද සකුයේහි 'වර්ෂ' යනු ද මෙයින් බිඳැගත් වදන් යැ. ඇති අරුත්හි 'ර' පස (අස්ත්‍යර්ථයේ 'ර' ප්‍රත්‍යයය) එක් වීමෙන් වස් මැ 'වසර' ද වේ (වස්+ර > වස්ර > වසර ). අවුරුද්ද හා සබැඳි වදන් සියල්ල හෙළ බසින් මැ විබෙදා අරුත් කියැ හැකි වදන් වීම, ලොවට අවුරුද්ද දුන්නේ ආදි හෙළයන් මැ බව තව ද දුරට තිරයන කරුණෙකි.

හිරු ගමන අනුවැ දවස් තුන් සිය හැට පහෙකැ අවුරුද්දක් ලොවට දුන් ආදි හෙළයෝ එය දොළොස් කොටසකට බෙදූ හ. එ සේ බෙදීමේ දී ඔවුන් යොදාගත්තේ සඳු ගමන යි. සොබාදමෙහි පියා ලෙස හිරුත් මව ලෙස සඳුත් සැලැකේ. එ හෙයින් අවුරුද්දෙකැ කල් මිනුම පිණිස හිරු ගමනත් අවුරුද්ද තුළැ කල් මිනුම පිණිස සඳු ගමනත් යොදාගැන්ම ආදි හෙළයන් ගේ සොබාහුරු සිතුම් මඟත් තකුහුරු නුවණත් මැනැවින් පෙන්වයි.

මේ අවුරුද්දෙහි දොළොස් කොටස මාස, මස් නමින් ගැනේ. එක් මසක් නම් සඳු පොළොව වටා වරක් යැමට යන දින ගණන හෙවත් දින තිසෙකි.

---

15.**සැරය,** පෙරවදනේ 11 වන පිටුව

මා නම් සඳ යි. (සඳ නැති දිනය අ+මා+වක > අමාවක යි.) අස් නම් අස් වීම යි. එක් සඳ ගමනෙකැ අස් වීම මා+අස් > මාස් වෙයි. මුලැ දිගු සර ලුහු වීමෙන් එ මැ මස් ද වෙයි[16].

දොළොස් මස ද ආදි හෙළයන් විසින් වෙන් වෙන් වැ නම් කැරිණ. මෙ සේ නම් කැරුණේ, ගොවිකම සිය උසස් මැ කම ලෙස සලකා එහි යෙදුණු අසුර හෙළයන් මැ විසින් බව, ගොවිකම මුල් කැරැගෙන එ නම් සියල්ල යොදා තිබීමෙන් පැහැදිලි වේ (දොළොස් මස් නම් වැළ බලන්නැ). මේ දොළොස් මස් නම් සියල්ල සොබාදහමට ද බෙහෙවින් එකඟ වෙයි.

ලොවෙහි ඉපැරැණි මැ හැදියා (සංස්කෘති) අතරැ ලා ගැනෙන බැබිලෝනියා, ග්‍රීක, රෝම ඈ හැදියාවලැ කල් මිනුමෙහි දී මුල් තැන ලැබුණේ සඳු ගමනට යි. අවුරුද්දෙකැ කල් පමණ (කාල ප්‍රමාණය) මිනිමෙහි දී ද එහි ලා සඳු ගමන මැ යොදාගැනිණි. ආදි හෙළයන් විසින් මේ රටවලැ දනවු පිහිටවන ලද හෙයින් සඳු ගමනින් කල් මිනීම ද ඔවුන් විසින් මැ ඇති කරන ලද්දකැ යි සැලකියැ හැකි.

මෙහි ලා ගැටලුවක් පැන නැඟියැ හැකි වෙයි. මිසරයට පමණක් හිරු ගමන අනුවැ කල් මිනුම පුරුදු කළ ආදි හෙළයන් බැබිලෝනියා, ගරයි (ග්‍රීසි), රෝම ඈ රටවලට සඳු ගමන අනුවැ කල් මිනුම පුරුදු කළේ කවර හෙයින් ද යනු යි.

හෙළ දනන් විසින් ලොවැ නොයෙක් රටවලැ දනවු පිහිටවන ලදුයේ එක් වරැ මැ යැ යි සිතිය හැකි නො වේ.[17] මිසරයට ගිය හෙළයන් හිරු ඇදැහිය තඳින් මැ ගත්තවුන් බව සිතීමට කරුණු බෙහෙවි.[18] එ හෙයින් ඔවුන් කල් මිනුමෙහි ලා ද හිරු ගමන වෙසෙසින්

---

16. වසරේ දොළොස් මස පිළිබඳ වැ අප ලියූ සවිසිතුරු ලිපියෙක් 1957 අප්‍රේල් මසැ 'රසවාහිනී' සගනුයේ '**දොළොස් මහ**' නමින් පළ වියැ. මෙහි නැති වැඩි විතර සඳහා එ ලිපිය බලන්නැ.
17. **සැරය,** පෙරවදන ද **හෙළ දෙරණ වග** 42-51 පිටු ද බලන්නැ.
18. පාරාවෝ ( උපහිරු ගොත ), සහරා (හිරු සහිත ) ඈ වදන් රැ සෙක් මේ හැඟුමට තුඩු දෙයි. **සැරයේ** පෙරවදන ද **හෙළ දෙරණ** වගේ 45-46 පිටු ද බලන්නැ.

සැලැකිල්ලට ගත් බවට සැක නැති. වැදැගත් මැ කරුණ වනුයේ යටැ කී බැබිලෝනියා, ගරසි, රෝම ඈ රටවලට දු මිසර හැඳියාව ඔස්සේ හිරු ගමනින් අවුරුදු මිනුමේ පිළිවෙළ පැතිරුැගිය බව යි. මෙ සේ බලන කල්හි හිරු ගමන අනුව ද කල් මිනුම ලොවට මැ හුරු කරන ලද්දේ සිංහළයන් විසිනි.

# අවුරුද්ද හා සබැඳි සොබාදහම

සිංහළ අවුරුද්ද එළැඹෙන්නේ බක් මසැ දී යි. බක් නම් බා අග මස යි (බා+අග > බග > බක්). එ නම් ඉසුරින් - භාග්‍යයෙන් අග තැන් ගන්නා මස යි (දොළොස් මස් නම් වැළ බලන්නා.

ලක් දිවැ පැහැදිලි වැ උතු බෙයක් (ඍතු භේදයක්) දැක්කැ නොහැකි නමුදු සිංහළ අවුරුද්ද එළැඹෙනුයේ වසත් උතුවට (වසන්ත ඍතුවට) අයත් කල්හි යැ. ගස් වැල් පල බරින් නැමී යන්නේත් ලක් දිවැ කාල ගුණයෙහි අමුතු මැ සිසිලසක් පණවත් බවක් ඇති වන්නේත්, කුරුල්ලන් කුඩු තනා බිජු ලන්නේත් මේ වසත් උතුවෙහි දී යැ.

මෙ සේ බලන කල්හි අලුත් අවුරුදු උලෙළ සොබාදහමෙහි අසිරිමත් සිරිය අවුරුද්දකට වරක් ඔප් නැංවෙන කලැ දී පැවැත්වෙන්නෙකි. කෙටියෙන් කිව හොත් අලුත් අවුරුද්ද සොබාදහම පිළිබැඳි උලෙළෙකි, සොබාදහමේ මහිමය විදහාලන උලෙළෙකි. සොබාදහමට අයත් ගස්වැල්, සතුන්, පොළොව, දිය ඈ මේ සියල්ල පවත්නේ හිරු නිසා යි. එ බඳු හිරු ගේ ගමන මුල් කොටැ අවුරුදු උලෙළ ඇති වීම මැ එය හා සොබාදහම හා අතර සබැඳියාව දක්වාලයි.

බක් මසැ දී අවුරුදු උලෙළ එළැඹෙන විට සිංහළයන් සිය කෙත්වලැ ගොයම් පාගාගෙනැ අවසන් යැ. ඔවුන් ගේ අටුකොටු සහලින් ඉතිරීගොසිනි. එ හෙයින් එය ඔවුනට සැණ කෙළි කෙළින්නට සුදුසුතම වූ සොම්නස්කුරු මැ අවදිය යි. එ මැ සොම්නස තව ද වවා වඩාලන්නේ කොවුලා ගේ සුමිහිරි නද යි. බක් මස මිනිස් ලොවට මතු නො වැ කුරුලු ලොවට ද මඟුල් අවදියෙකි. එ හෙයින් කොවුලා ද ඒ සුමිහිරි 'කොහෝ' නදින් කරන්නේ සිය පෙම්වත් කෙවිලිය කැඳැවීම යි. අවුරුදු ළඟ මැ එන බව ලක් දනන් දැනැගන්නේ මේ කොවුල්

නඳිනි. මේ කොවුලා පරපුටු නමිනුදු හැඳින්වේ. ඒ ඌ කැදැල්ලක් නො තනා කපුටු කැදැලිවලැ මැ බිජු ලන හෙයිනි.[19]

කොවුල් නද මෙන් මැ ලක් දනනට අවුරුදු සමය හඟවන මල් වෙසෙසෙකුදු වෙයි. ඒ එරබදු මල යි. අවුරුද්ද උදා වන වසත් සමයේ දී හැම ගසක් මැ වැලක් මැ මලින් පලින් පිරියන නමුදු අවුරුදු උදාව හඟවන වෙසෙසි මැ ලකුණ වනුයේ එරබදු මල යි.[20]

ලක්දිවැ හැම පෙදෙසෙකැ මැ වැඩෙන එරබදු ගස දෙ වැටවලැ බෙහෙවින් දක්නා ලැබේ. තද පැහැ කුඩා මල් එරබදු ගසේ හටගනී. අවුරුදු සමයේ දී මුළු ගස මැ එක මැ රතු රෙද්දක් මෙන් පෙනියන පරිදි ගස පුරා මල් හටගනී.

එරබදු මල් පොට්ටු පොට්ටු
අවුරුද්දත් කිට්ටු කිට්ටු

වැනි ගැමි කවි තැනී ඇත්තේ මේ නිසා යැ. ඔසුවක් විසින් ද එරබදු ගසෙහි වෙසෙසි ගුණ කිහිපයෙක් ඇති.

---

19. සිය මිහිරි හඬ නිසා මැ කොවුලා හෙවත් කොහා අපේ ලිවිසැරියේ (සාහිත්‍යයේ) ද නිතර මැ සඳහන් වන්නෙකි. ඉන්දියා කොවුලා, යුරෝපිය කොවුලා, පුංචි කොවුලා, මරමිණි කොහා, කවුඩු කොහා, ගෝමර කොණ්ඩ කොහා ඈ විසින් කොවුල් පවුලට අයත් කුරුලු වග ගණනක් ඇති නමුදු කොහා හෙවත් අවුරුදු කොහා නමින් හැඳින්වෙන්නේ අවුරුදු සමයේ හඬ ලන කොහා යි.

20. තුරුවිදු දරුවන් (උද්භිද විද්‍යාඥයන්) මෙ ගස හඳුන්වන්නේ 'එරිතිනා වරියෝගාටා' නමිනි. ලක්දිවැ හැම පෙදෙසෙක මැ පාහේ බෙහෙවින් වැවෙන ගසෙකි. මෙහි පස් වග මැ සිංහළ වෙදකමෙහි දී ගැනේ. සකු බසින් 'පාරිභද්‍ර' නම් මේ එරබදු යැ.

# අවුරුදු නකත්

නකත් යන්න දෙ අරුතෙකින් සිංහලයෙහි යෙදේ. පළමු වැ, නකත් තරු කෙත්, එ නම් සත් විසි නකත හඳුන්වනුව නකත් යන්න යෙදේ.

දෙ වනු ව, සුබ හෝ අසුබ හෝ මොහොත හඳුන්වනු පිණිස ද නකත් යන්න සිංහළ වහරෙහි යෙදේ.

හිරු මින්(මීන) රැසින් මිදුණු නමුදු හෙළු රැසට නොපැමිණෙන තෙක් කාලය නොනගත (නො+අගත>නොනගත, 'න' මැදට පැමිණීමෙනි. හිමි+අඹු > හිමිනඹු ඈ සසඳන්නැ) නමින් හැඳින්වේ. මේ නොනගතය පෙර (පූර්ව) හා පසු (අපර) හා විසින් දෙකට බෙදේ. පසු කොටසෙහි (අපර භාගයෙහි) යෙදෙන සුබ මොහොත් යැ අවුරුදු නකත් නමින් ගැනෙනුයේ.

නොනගතයෙහි පෙර කොටසෙහි (පූර්ව භාගයේ) දී පන්සල් ගොස් පින්කම් කොටැ ඉක්බිති අවුරුදු උදාවත් සමඟ නකත් වේලාවට සිරිත් විරිත් ඉටු කරනු ලැබේ. මුලින් මැ කැරෙනුයේ ළිපෙහි ගිනි මෙළැවීම යි. පස් මහ බූවන් (පංච මහා භූතයන්) අතරැ ද එකකු වන ගින්න මිනිසි දිවියට ඉතා මැ ඇවැසි බව නො කිව මනා යැ. එ හෙයින් අලුත් අවුරුද්දේ කැරෙන මුල් මැ කිරිය අලුතින් ළිප් බැඳ ගිනි මෙළැවීම යි. ඉක්බිති වැ එ මැ ළිපෙහි කිරිබතෙක් පිසිනු ලැබේ.

ඉක්බිති වැ එළැඹෙන සුබ නකත් වේලාවේ දී වැඩ අල්ලා ගනුදෙනු කොටැ අහර බිදීම සිදු කැරේ. වැඩ ඇල්ලීමේ දී බොහෝ විට කැරෙනුයේ සිය රැකියාව හා සබැඳි යම් කටයුත්තක් කිරීම යි. එ සේ නැත හොත් කිරි ගසකට කැත්තෙකින් කෙටීම ද කැරේ. කුඩාවෝ පාඩම් වැඩෙහි යෙදෙති.

නකතට ගනුදෙනු කැරෙනුයේ වැඩිහිටියකු සමඟ යි, නැත හොත් තමාට වඩා ඉසුරුමතකු සමඟ යි. එහි දී තමාට ලැබෙනවාට වැඩි මුදලක් ආපසු දීම සිරිත යි.

අහර බිදීම කැරෙනුයේ ඉන් අනතුරු වැ යි. නකතට පිසූ කිරිබත් ද කැවුම්, කොකිස්, අලුවා ඈ රස කැවිලි ද කෙසෙල් පල ද කෑමට ගැනේ.

අවුරුදු දිනයෙන් පසු වැ ද නකතට කැරෙන කටයුතු ඇති.

ඉන් මුලට මැ වන්නේ හිස තෙල් ගා නෑම යි. (තෙල් යනු ද මේ සිරිත නිසා මැ නිපන් හෙළ වදනෙකි. හිසෙහි ඇතිල්ලෙනුයේ - ඇතිල් > තිල් > තෙල්). මේ, දෝ සතරත් (ජ්‍යෝතිෂයත්) වෙද සතරත් එක් කරන සිරිතෙකි. හිසට ද පයට ද නියමිත කොළ වග තබා ඔසු යොදා තැනූ තෙල් නකත් වේලාවේ දී ගෑමෙන් පසු දිය නෑම සිදු කැරේ. තෙල් ගෑම සිදු කැරෙන්නේ වැඩිහිටියකු අතිනි. නැත හොත් වෙද මහතා හෝ පන්සලේ නාහිමියන් හෝ වැනි උතුමකු අතිනි.

අලුත් අවුරුද්ද අවසන් වනුයේ කෙළි දෙලින් ගත කළ දින කිහිපය අවසන් කොටැ නැවැත සිය රැකියාව ඇරැඹීමෙනි. එ ද සුබ නැකැතෙකින් මැ කැරේ. අවුරුද්දෙහි අවසන් නකත ද එයයි.

මෙහි දැක්වුණේ පොදු විසින් කැරෙන අවුරුදු සිරිත් යැ. පෙදෙසි විසින් (ප්‍රාදේශික වැ) කැරෙන ඇතැම් සිරිත් ද වෙයි. කුණු මුත්තා පිදීම එ බන්දෙකි. නැකැතෙකින් තොර වැ කැරෙන අවුරුදු සිරිත් විරිත් ද ඇති. එයින් මුලට මැ කැරෙන්නේ පරණ අවුරුද්ද පිණිස දිය නෑම යි. එ ද මහනුවර කලැ දී නකතට මැ කැරුණු බව ඩේවි ගේ පොතින් පෙනේ. පරණ අවුරුද්දෙහි පැවැති කිලිටි බව එයින් සේදී යති යි සිංහළයෝ සිතති.

අලුත් අවුරුදු දිනැ, බුලත් හුරුලු පිළිගන්වා සිය දෙමාපියනට, වැඩිහිටියනට වැඳැ පරණ අවුරුද්දෙහි කැරුණු වැරැදි ඇතොත් ඒ සියල්ල කමා කැරැගනු ලැබේ. දුරැ වෙසෙන සිය නෑදෑයන් බලන්නට කඳමලු බැඳැගෙනැ නෑගම් යෑම ද අවුරුදු දිනවලැ සිදු කැරේ.

අලුත් අවුරුද්ද සඳහා සඳ බැලීම ද සිංහළයන් ගේ වෙසෙසි සිරිතෙකි. මේ සඳහා නකත් ඇදුරන් කී දිනයෙක් යොදාගැනේ. එයට පෙර සඳ දෙස නොබැලුව මනා යැ යි සම්මතයෙක් පවති. දඹදිවට ද නව සඳ බැලීමේ සිරිත ගියේ ලක් දිවිනි. දඹදිවියෝ අවුරුද්දෙහි කවර දිනැ වුවත් නව සඳ වඳිති. "ප්‍රථම වයසි චන්ද්‍රඃ - සර්වලොකෛක වන්ද්‍යඃ" යැ යි කියනුයේ එ හෙයිනි.

# අවුරුදු කෑම බීම

අවුරුදු දින වෙසෙසි කෑම බීම, බෙහෙවින් මැ රස කැවිලි තැනුම සිංහළයන් ගේ සිරිතෙකි. යට දැක්වුණු සෙයින් කිරිබත් පිසීම නකතට සිදු කැරේ. නකත් ඇදුරන් කියන පරිදි මුං, තල ඇ ඇට

වග ද ගිතෙල් උක් හකුරු ආදිය ද එයට යොදනු ලැබේ. අවුරුදු කෑමෙහි දී මුල් තැන ලැබෙනුයේ මේ කිරිබතට යි[21].

අවුරුදු කැවිලි අතර වෙසෙසි තැනක් ගන්නේ කැවුම් යැ. කොණ්ඩ කැවුම්, අතිරස, මුං කැවුම්, ඈ විසින් නොයෙක් කැවුම් ඇති. සිංහළ කැවිලි අතරැ කැවුම් වෙසෙසි වන බවට යටගියායෙනුදු දෙස් ලැබේ.[22] ආස්මී, අළුවා, අග්ගළා, දොදොල්, වැලි තලප ඈ කැවිලි ද අවුරුදු කෑමට ගැනේ. ලන්දේසින් ගෙන් ලැබුණු කැවිල්ලක් ලෙස සැලකෙන කොකිස් ද අද සිංහළ කැවිලි මෙන් මැ අවුරුදු කෑමෙහි දී මුල් තැනට එයි.

# අවුරුදු කෙළි සෙල්ලම්

අවුරුදු උදාව සිදු වන්නේ ලක් දිවැ දනන් අස්වැන්න කපාගෙන ඉසුඹු සුවයෙන් සිටිනා කලෙකැ දී බව යටැ දැක්විණ. මෙ කලැ වැසි, සුළං ආදියෙනුදු ගහටෙක් නො වේ. එ හෙයින් සිංහළයන් ගේ වෙසෙසි කෙළි සෙල්ලම් පැවැත්වෙන්නේ ද මේ අවදියේ දී යි.

මේ කෙළි සෙල්ලමෙහි පදනම වන්නේ ද සිංහළයන් ගේ මහ කම වූ ගොවි කම මැ යි. මුළු අවුරුද්ද පුරා ම ගොවිකමෙහි යෙදී වෙහෙස වන සිංහළයන් ගේ කෙළි සෙල්ලම් මහිනුදු එ මැ ගොවි දිවිය පිළිබිඹු වීම පුදුමයෙක් නො වේ.

---

21. කිරිබත මඟුල් අහරක් සේ ගැනේ. හෙළ ලිවිසැරියෙහි බෙහෙවින් සඳහන් ලබන අහරෙකි. හෙළයන් ගේ හැම උලෙළෙකැ දී මැ කිරිබත් ද දක්නා ලැබේ. ගිතෙල්, තල, මුං ඈ විසින් එයට එක් කැරෙන දෑ අනුවැ එහි ගුණ ද වෙනස් වේ. ඉඹුල් කිරිබත් නමින් ගැනෙන්නේ මැදට පැණි පොල් දමා පිළියෙළ කළ කිරිබත් යැ.

22. සිංහළ රස කැවිලි අතරැ අග තැනට ගැනෙනුයේ කැවුම් යැ. පැරැණි පත්පොත්හි 'පු' නමින් එනුයේ මේ යැ. 'පු' යන්නට ඉදිරියෙන් වෙසෙසුනක් යෙදු කලැ වෙනත් අහර ද ගැනේ. දැල්පු (ඉඳි ආප්ප වැනි අහරක්), හැළපු (හැළියෙහි පිසින පු, හැළප) ඈ විසිනි. කොණ්ඩ කැවුම්, අතිරස ඈ ලෙස වග ගණනෙකැ කැවුම් වෙයි.

අවුරුදු දිනවලැ වෙසෙසින් කැරෙන්නේ රබන් ගැසීම යි. එ සඳහා මැ නිමැවුණු රබන් පද ද ඇති. රබන් ගැසීම ගැහැනුනට මැ ඇරුණු කටයුත්තක් වුව ද ඇතැම් විටෙක පිරිමිනුදු එහි යෙදෙනු දැක්ක හැකි යි.

ඔංචිලි පැදීම ද අවුරුදු දිනවලැ කැරෙන සතුටු කෙළියෙකි. බමර ඔංචිල්ලා, කතුරු ඔංචිල්ලා, වැල් ඔංචිල්ලා ඈ විසින් එය ගණනෙක් වෙයි. ඔංචිලි පැදීමේ දී ද ගයන ගි ඔංචිලි' වාරම් නම් වෙයි.

පංච කෙළිය, නෙරෙංචි ඇදීම, ගල් පෙළීම, ඔළිඳ කෙළිය ආදිය අවුරුදු දිනවලැ කැරෙන ගෙ-කෙළි (ගෘහස්ථ ක්‍රීඩා) වෙයි. මේ දිනවලැ මැ, වෙසෙසින් දෙවියන් ගේ පැහැදීම ලබාගනුව ගම මැ එක් වැ ගෙනැ කැරෙන කෙළි සෙල්ලමුදු වෙයි. අං ඇදීම ද පොර පොල් ගැසීම ද එ බඳු කෙළි අතරැ ගැනෙයි.

# සිංහළ අවුරුද්ද

වැවහර දින පිළිවෙළින් අප්‍රේල් 13 වන දා පවත්වන අලුත් අවුරුදු උළෙල සිංහළයන් විසින් මැ ඇරැඹුණු, සිංහළයන් විසින් මැ දිගට මැ පැවැත්වුණු එකක් බව මෙ තෙක් දැක්වුණු කරුණුවලින් පැහැදිලි යැ. එහෙත් රජයේ කටයුතුවලැ දී සිංහළ-දෙමළ අලුත් අවුරුද්ද නමින් මේ හැඳින්වෙයි. එ හෙයින් මෙ ගැන මඳක් කරුණු විමසා බැලීම වටී.

නමින් මැ හෙළි වන පරිදි හින්දු දහම හෙළදිවින් දඹදිවට ගිය දහමෙකි.[23] එහෙත් අද පවත්නා හින්දු දහම අනුවැ දවස් 365ක අවුරුද්දෙක් නැති. එයට හෙය නම් බඹ ලොවෙහි එක් දිනක් මිනිස් ලොවෙහි එක් අවුරුද්දක් වීම යි. දිව-රෑ විසින් වසර දෙකට බෙදුම හින්දු සිරිතෙකි. මෙයින් දිවා කොටස ඇරැඹෙන්නේ ජනවාරි 15 හෝ එ ළඟැ දිනෙකැ හෝ යෙදෙන 'තෛපොංගල්' උළෙළිනි. රෑ කොටස ඇරැඹෙනුයේ ඔක්තෝබර මස අගැ හෝ නොවැම්බර මුලැ හෝ යෙදෙන දීපාවලි උළෙළිනි. එ හැරැ අන් අවුරුද්දෙක් ඔවුනට නැති.

---

23. හෙළ දෙරණ වග 22-23 පිටු බලන්න.

දඹදිවෙහි ද නැති අවුරුදු දිනයෙක් ලංකාවේ දෙමල හින්දුනට වෙයි. ඔහු එය 'චිත්‍ර වර්ෂම්' හෙවත් 'සිත්තර වර්ෂ' නමින් ගනිති. එහි අරුත අවුරුද්දේ හතර වැන්න යනු යි. අවුරුද්දේ හතර වැනි මස අප්රේල් වන්නේ ඉංගිරීසි දින දසුන අනුව යි. මේ 'චිත්‍ර වර්ෂම්' යන්න ඉංගිරීසි පාලන සමයේ දී මෙ රටැ ඇති වූවක් බව ඉන් මැ පෙනේ. තව ද, හින්දූන් ගේ මේ උලෙළ සිංහල අවුරුද්ද මෙන් නො වැ හෝරා හතරෙකින්, පසෙකින්, නැත හොත් වරුවෙකින් නිමහම් දක්නෙකි. මේ කුමක් පිණිස පැවැත්වෙන්නෙක් දැ යි කිමට හින්දූහු ද නො දනිති.[24]

මෙ කී කරුණු අනුවැ පෙනෙනුයේ සිංහල අවුරුද්ද සිංහළයාට මැ වෙසෙසි වූ උලෙළක් බවත් එය සිංහළ-හින්දු, නැත හොත් සිංහළ-දෙමල අවුරුද්දක් කරන ලදුයේ ඉතා මෑතෙක දී, ඉංගිරීසි පාලකයන් විසින් බවත් යැ.[25]

## අවුරුදු ඇගැයුම

සිංහළ අවුරුද්ද සිංහළයන් ගේ යටගියාව හෙළි කරන, ලොවට ගිය සිංහළ උරුමය මතු කරන වෙසෙසි දවසක් බව යටැ දැක්විණ. එය අවුරුද්දෙහි පළමු අගය සේ ගිණියැ හැකි යි. මෙහි ලා තව ද අගයක් දක්නට ඇති. එ නම් දැයෙහි - ජාතියෙහි - පැවැත්ම ද හැඩ ගැස්ම ද උදෙසා මෙ මඟින් කැරෙන මෙහෙය යි.

---


24. මේ කොටසෙහි එන කරුණු බොහෝවක් මැ උපුටා ගැනුණේ ආචාර්ය සූරිය ගුණසේකරයන් 2004.04.12 වන දින බදාදා දිවයිනට ලියූ 'අලුත් අවුරුද්ද සිංහල ද, දෙමළ ද, හින්දු ද' යන ලිපියෙනි. ඔවුනට අප ගේ නොවක් පැසසුම හිමි යැ.

25. සිංහළ අවුරුද්ද සිංහළ-හින්දු අවුරුද්දක් බවට පත් කැරුණේ 1885 මාරතු 17 වන දින නිකුත් කැරුණු රජයේ 'ගැසට්' පතිනි. එ සේ කැරුණේ පොන්නම්බලම් රාමනාදන් වැනි දෙමල නායකයන් සැනසිම පිණිස උපායක් ලෙසිනි. එය සිංහළ-දෙමල අවුරුද්ද ලෙස නිල කැරුණේ 1984 දී ජේ.ආර්. ජයවර්ධන රජය විසිනි.

'අලුත් අවුරුද්ද' සෙයින් ද මේ හැඳින්වේ. 'අලු' නම් එළිය යි. අලු මැ අලුත් වනුයේ සියරුත් නම්දුනු (ස්වාර්ථ තද්ධිත) 'අත්' පස (ප්‍රත්‍යයය) එක් විමෙනි. අලුත් අවුරුද්දේ දී හැම දෙයෙක් මැ අලුත් වෙයි: එළියක් ලබයි. බැහැරි විසින් ගත් කලැ අලුත් ඇඳුම්, අලුත් බඩු මුට්ටු මිල දී ගනු දැකියැ හැකි ය: ගෙදොරවලට අලුත් එළියක් දෙනු දැකියැ හැකි යි. එ හෙත් එ පමණෙක් නො වේ. ඇතුළු විසින් ද - ආභ්‍යන්තරික වැ ද - සිංහළයෝ අලුත් වෙති. කලින් අවුරුද්දේ කිසිවකු සමඟ අමනාපයෙක් වී නම් ඒ අත්හැරැ මිතු සබඳකම් තර කැරැගැනේ. දෙමාපිය-වැඩිහිටියනට බුලත් දී වැඳීමෙන්, නෑගම් යෑමෙන් නෑ සබඳතා අලුත් කැරැගැනේ. කොටින් මැ අලුත් අවුරුද්දේ සිංහළයෝ අලුත් දිවියක් අරඹිති.

සිංහළ අවුරුද්ද තවත් ලෙසෙකින් අගය කළ හැකි යි. ඒ දැය මැ එකමුතු කරන දිනයක් ලෙසිනි. එක මැ නකත් වේලාවට මුළු දැය මැ එක් කටයුත්තෙකැ බැඳෙන හෙයින් සිංහළ අවුරුද්ද දැය එකමුතු කරන, දැයෙහි සමඟිය ඇති කරන, දෑ හැඟුම වඩවන දිනයක් ලෙසින් සැලකිය හැකි යි.

එ මෙන් මැ දැයෙහි ඉදිරි ගමනට ඉවහල් වන වේලාවට වැඩ කිරීම, කෙළෙහි ගුණ සැලකීම වැනි ගුණ දහම් හුරු වීම ද අවුරුද්දෙන් ලැබෙන තව ද පලයෙකි.



රාශි චක්‍රය

එහි දී අහස අංශක 360කට ද නැවත රාශි 12කට ද නකත් සත් විස්සකට ද බෙදා ඇත. නකත් සත් විස්ස යනු ප්‍රධාන තාරකා විසි හතෙකි.

පළමු වන උපැඳිය

# දොළොස් මස් නම් වැළ

## 1 බක්

සිංහළ අවුරුද්දේ පළමු මාසය යි. හිරු කොග්ගලැ වළස්ගල මතින් මුදුන් වෙමින් නව වටය අරඹන මස බක් නම් වෙයි.
භාග්‍යයෙන් (බා) අග්‍ර (අග) මස,
බා + අග > බග > බක් වෙයි.
"නව බක් ළසඳ දුටු පුරිසක්හු නොවජන්නෙයි' (සීගිරි ගීය)

## 2 වෙසක්

බක් මසින් ඇරැඹෙන හෙළ අවුරුද්දේ දෙ වන මාසය යි. බුදු හිමියන් ගේ තෙ මඟුල සිදු වූ මස ද මේ වෙයි.
වෙස් + අග > වෙසග > වෙසක් වෙයි. වෙසක් මසෙහි දී ලොවැ මැ අග වෙස් (අග්‍ර වේශය) ගන්නා සැටි මැනැවින් දැකියැ හැකි යි. තුරැලිය මලින් පෙලෙන් සැරැසෙයි. සතුන් අතැරැ දු සොම්නස්බර හැසිරීමෙක් ඇති වෙයි.

## 3 පොසොන්

බක් මසින් ඇරැඹෙන සිංහළ අවුරුද්දේ තුන් වන මස යි. මේ සැණකෙළි මසෙකි. මිහිඳු හිමියන් මෙහි වැඩම කරන අවදියේ ද පැවැති පොසොන් උලෙළ වඩා මැ ඇත සමයෙක උරුමයක් දක්වයි. මෙහි පෝ නම් පෝය යි. සොන් නම් පුතා යි.
පොසොන් (පෝ + සොන්) නම් පුතා උපන් පෝය යි.

## 4 ඇසළ

සිංහළ අවුරුද්දේ සිවු වන මාසය යි.
අස් > අළ + අසළ > ඇසළ වෙයි.

## 5 නිකිණි

සිංහල අවුරුද්දේ පස් වන මාසය යි.

පසු වැ එන වැසි මසට කලින් ඇළ වේලි පිරිසුදු කරන හෙයින් ද, වස් සඳහා වන වන් තවුසන් (ඉසිවරුන්) ගම් බලා වඩනා හෙයින් ද පිරිසුදු (හෙළ) මස වේ.
කුණු නැත්තේ නු + කුණු > නුකුණු > නිකිණි නම් වේ.

## 6 බිණර

සිංහල අවුරුද්දේ ස - වන මාසය යි. වැහි කෝඩ මස යි. බිය (බියකුරු) හෙණ (අකුණු) කරණුයේ බිය + හෙණ + කර > බිණර යි.

බිණර යනු ගැමි වහරේ බිඬර ද වෙයි. 'ණ' හට 'ඬ' වීමෙනි.

## 7 වප්

සිංහල අවුරුද්දේ සත් වන මස යි, වපුරන මස යි. දිය බැඳ දිය ඉසිලීමට සලස්වා කරන කම හෙයින් වා (උහුලන) + අප් (දිය) > වාප් > වප් යැ.

වප් කිරිම නම් වැපිරීම යි. වප් + කුරු > වපුරු. වැපිරීම කරන මස වප් යැ.

## 8 ඉල්

ඉල් යනු සිංහල අවුරුද්දේ අට වන මස යි.

වප් මසැ වප් (වැපිරීම) කළ කුඹුරේ ඉල් (කොළ) සැදෙන මස ඉල් යැ.
උල් හැඩය නිසා කොළ 'උල්' වෙයි. උල් මැ ඉල් වෙයි.
අනු + ඉල් > නිල් (කොළවලැ පැහැය). ආදිය ද සලකන්නැ

## 9 උඳුවප්

සිංහල අවුරුද්දේ නව වන මස යි.

වැපිරිල්ල ඉදෙන (පැහෙන) මස යි. උඳනුයේ උඳු යි. උඳු + වප් > උඳුවප් > උඳුවප් වේ.

## 10 දුරුතු

සිංහල අවුරුද්දේ දස වන මස යි.
කෙත් කමින් දුරු විමේ මස යි. වප් මසැ වැපිරු, ඉල් මසැ කොළ ඇදුණු, උඳුවප් මසේ ඉදුණු (පැසුණු) කෙත ඉසිඹු ලබන මස මේ වෙයි.

කෙත් කමින් දුරු බව ඇත්තේ දුරු + තු > දුරුතු යි. බුදු රදුන් මුලින් මැ හෙළදිවට වැඩියේ මේ දුරුතු ඉසිඹුවේ දී යැ.

## 11 නවම් ·

සිංහල අවුරුද්දේ එකොළොස් වන මස යි.


දුරුතු ඉසිඹුවෙන් පසු නැවැත කෙතේ නවකම් ඇරැඹෙන මස නවම් වෙයි.

මෙහි නවකම් නම් පුරන් කෙටීම යි. නව + කම් > නවහම් > නවාම් > නවම් වෙයි.

## 12 මැදින්

බක් මසින් ඇරැඹෙන සිංහල අවුරුද්දේ දොළොස් වැනි හෙවත් අවසන් මස යි.

මාස් කන්නයට - දින්-(ධාන්‍ය) වපුරන මාසය මහ + දින් > මදින් > මැදින් වෙයි. නදුන් මැ නැදුන් වූ තන්හි මෙනි.
නවම් මසේ නවකම් කළ කෙතේ මාස් කන්නෙට වපුරන මස මැදින් වෙයි.




1. *Aries.* 2. *Taurus.* 3. *Gemini.* 4. *Cancer.* 5. *Leo.* 6. *Virgo.*

7. *Libra.* 8. *Scorpio.* 9. *Sagittarius.* 10. *Capricorn.* 11. *Aquarius.* 12. *Pisces.*

# දොළොස් රැස් නම් වැළ

## 1 එළු රැස

හෙළු > එළු

හෙළු දිව මුඳුනින් ඇරැඹෙන රැස - දොළොස් රැසෙහි මුල් මැ රැස - හෙළු රැස වෙයි. හෙළු මැ එළු වුයේ 'හ්' හැලීමෙනි (ලොප් වීමෙනි).

(සකු නම - මේෂ)

## 2 ගොන් රැස

රාසි දොළහෙන් දෙ වන රැස යි. පළමු සිවු රැසියෙහි ( සතරේ ගොඩෙහි) දෙ වන රැස යි.

එළු රැසින් පසු හිරු ගමන් ගන්නා රැස, යි. ගන් > ගොන් වෙයි. 'ග' ගමන් ගැනීමෙහි පවතු (ධාතු) යි.

(ස. වෘෂභ)

## 3 මිතුන රැස

දොළොස් රැසින් තුන වන රැස ද පළමු සිවු රැසියෙහි තුන් වන. රැස ද වන හෙයින් මහ තුන යන අරුත් ගෙනැ මිහි + තුන මිතුන වෙයි.
මහ බව ඇතියේ මහ + ඉ > මිහි වෙයි.
මෙහි 'ඉ' යනු ඇති අරුත් (අස්ත්‍යර්ථ) නම්දුනු (තද්ධිත) පස (ප්‍රත්‍යයය) යි.

මහ පොළොව 'මිහි' වුයේ ද මහ බව (මහ + ඉ > මිහි ඇති නිසයි) මහ මුත්තා (මී මුත්තා) මහ හරක් (මී හරක්) ඇ විමසන්නැ.

(ස. මිථුන)

## 4 කටක රැස

දොළොස් රැසේ සිවු වන රැස යි. පළමු සිවුරැසියෙහි සිවු වන රැස යි. 120න් කැඩීම දක්වන හෙයින් කට + ක නම් වෙයි.

කට පවතුව (ධාතුව) කටා-කටති-කැටී-කැටූ යනුයෙන් පර (පරස්මෛ) පදයෙහි ද කැටේ-කැටෙති-කැටිණි-කැටුණු යනුවෙන් අත් (ආත්මනේ) පදයෙහි ද වර නැඟේ.

මෙහි 'ක' නම් 'බිම' යනු යි. කැඩි බිම කටක යි.

(ස.කටක)

## 5 සී රැස

දොළොස් රැසින් පස් වන රැස යි. දෙ වන සිවුරැසියෙන් ඇරැඹෙන රාසිය, සිය රැස > සී රැස වෙයි.

(ස.සිංහ)

## 6 කන්නි රැස

දොළොස් රැසින් ස වන රැස යි. දෙ වන සිවු රැසියෙහි දෙ වන රැසයි. අංසක 360ක් වූ රාසි සකේ 180න් ඇරැඹෙන රැස යි. කන්හි (කොන්හි) වූයෙන් කන්හි > කන්නි වෙයි.

(ස.කන්‍යා)

## 7 තුලා රැස

දොළොස් රැසෙහි සත් වන රැස යි.

දෙ වන සිවු රැසියෙහි තුන් වන රැස යි. 360ක් වූ රාසි සකේ 180න් ඇරැඹෙන හෙයින් තුලනය වන රැස තුල > ආ > තුලා වෙයි.

(ස. තුලා)

### 8 විසචික රැස

රාසි දොළොසින් අට වන රැස යි. දෙ වන සිවු රැසෙහි සිවු වන රැස යි.

අට වැන්න විස යැ යි සැලැකෙන හෙයින් විස මැ විසචි වෙයි. මෙහි 'චි' ඇති අරුත්හි පස (ප්‍රත්‍යයය) යි. විසචි බිම විසචි + ක > විසචික වෙයි. 'ක' නම් බිම යි.

(ස. වෘශ්චික)

### 9 දුනු රැස

රාසි දොළොසින් නව වන රැස යි. තෙ වන සිවු රැසියෙහි මුල් රැස හෙයින් තුනට පැමිණියේ යන අරුතින් තුන් + උ > තුනු වෙයි. තුනු මැ දුනු වෙයි.
(ස. ධනු)

### 10 මකර රැස

රාසි දොළොසින් දස වන රැස යි. තුන් වන සිවු රැසියේ දෙ වන රැස යි.
මැකීම ඇතියේ මක + ර > මකර යි.
මක + ර > මකර
දියර, මිහිර, පොහොර
ඈ තන්හි දු 'ර' ඇති අරුත්හි නම් දුනු පස (තද්ධිත ප්‍රත්‍යයය) යි.

(ස.මකර)

### 11 කුඹු රැස

දොළොස් රැසින් එකොළොස් වැන්න යි. මේ අය රැස යි. ආදි හෙළයන් මිල එකතු කළ කුඹුවේ (කළයේ) නම මැ මෙ රැසට ද යෙදේ (කළය 'කුඹු' නම් වනුයේ කුඩා මුවක් (කුමු) ඇතියෙනි. කුමු > කුඹු



(ස.කුම්භ)

## 12 **මීන් රැස**

දොළොස් රැසින් අවසන් රැස යි. තුන් වන සිවුරැසියෙහි ද අවසන් රැස යි. එ හෙයින් නිම් රැස මීන් නම් වේ.
වක, කව වන තන්හි මෙන් අකුරු පෙරැළියෙන් නිම් > මීන් වේ.

(ස. මීන)

# සත් විසි නකත් නම් වැළ

## 1 අස්විද

නකත් තරු කෙත් විසි හතින් මුල් මැ තරු කෙත යි. එ නම් මුල් මැ නකත යි. අස් (අංසක) විදැහිම - පෙරට විදැහිම පටන් ගැනෙනුයේ මේ නකතේ සිට හෙයින් අස් + විහිද > අස්විද වෙයි. අහස් වටය මුලින් මැ අංසක 360කට බෙදුවන් ආදි හෙළයන් මැ බව මෙ වදනින් ඉඳුරා තිර වෙයි. මේ කේතු හිමි නකතෙකි.

(සකු නම-අශ්විනි)

## 2 බෙරණ

සත් විසි නැකැතින් දෙ වැන්න යි. සිකුරු හිමි පළමු වැන්න යි. අස්විදෙන් ඇරැඹුණු අංසක විදැහිම (ඒ ඒ තරු කෙතට අයත් තරු බෙදුමෙන් ) පෙරට අරනුයේ - ආරෝහණය කරනුයේ බේ + අරණ > බෙරණ යි.

(ස. භරණී)

## 3 කැති

තුන් වන නකත යි. රවි හිමි පළමු වැන්න යි. ති + ක > කති > කැති වෙයි. මෙහි 'ත' නම් තුන යි. තුන් වන තරු බිම යනු අරුත යි. තික > කති වනුයේ ගතකුරු (ගාත්‍රාක්ෂර) මාරුවෙන් ද 'අ - ඉ' යන පණකුරු (ප්‍රාණාක්ෂර) 'ඉ - අ' යැ යි මාරුවෙන් ද වෙයි.

(ස. කෘත්තික)

4 **රෙහෙන**

සතර වන නකත යි. සඳු හිමි පළමු වැන්න යි. රේ(රවි) ගේ පළමු වන නකත වන කැතියෙන් පසු වැටෙන (හෙන) නකත හෙයින් රේ + හෙන > රෙහෙන වෙයි.

(ස. රෝහිණී)

5 **මුවසිරස**

සත් විසි නැකැතින් පස් වැන්න ද කුජ හිමි පළමු වැන්න ද වේ. කුජ අසුබ ග්‍රහයෙකි. එ හෙයින් අවමඟුල් කුජට මඟුල් (මංගල) නම දුන්නා සේ ඔහු හිමි නකත ද සුබ නමෙකින් හැඳින්විණි. එ නම් සිව (යහපත්) මුර (වාරය) යන්න යි. සිවමුර මැ මුවසිර වේ.(තුරුපල > පලතුරු වූ සේ සලකන්නැ). එ මැ මුවසිර මැ මුවසිරස් වනුයේ ඇති අරුතෙහි 'අස්' පස (ප්‍රත්‍යයය) එක් වීමෙනි.

(ස. මෘගශිර්ෂ)

6 **අද**

ස වන නකත යි. රාහු හිමි පළමු වන නකත යි. ස වනු වැ ඇදෙන හෙයින් ස + අද > සද > හද > අද වෙයි.
(සකුරු > හකුරු > අකුරු වූ සේ ද විමසන්නැ)

(ස. ආර්ද්‍රා)

7 **පුනාවස**

සත්විසි නැකැතින් සත් වැන්න යි. ගුරු හිමි පළමු වැන්න යි. ගහ තරු වැලේ ලොකුතමයා ගුරු යි. මනා (උතුම්) නායකයා යන අරුතින් ගුරු පුනා (පු + නා) වෙයි.
පුනා ගේ වස (වාසය) පුනාවස යි.

(ස. පුනර්වසු)

8 **පුස**

අට වැනි නකත යි. සනි හිමි පළමු වැන්න යි. පුනා හෙවත් ගුරු අසැ (ළඟ) වූ හෙයින් (පු + අස) පුස වියැ. (මෙහි පුනා යනු පු යැ යි කෙටි කොටැ ගැනිණ. මෙ සේ වදන් කෙටි කොටැ ගැනිම හෙළ බසේ වදන් නියරට එකඟ යි. නිද. බිය + හෙණ + කර > බිණර)

(ස. පුෂ)

9 **අස්ළිස**

නව වන නකත යි. බුද හිමි පළමු වැන්න යි. ළිස නම් දහය යි. අස නම් සමීපය යි. දස වන (ළිස) නකත අස වූයෙන් අස + ළිස වේ.

(ස. ආශ්ලේෂ)

10 **මා**

නකත් තරු විසි හතෙන් දස වැන්න යි. කේතු හිමි දෙ වැන්න යි. දෙ වන නකත් නැව්යෙහි (නව වන ගොඩෙහි) පළමු වන හෙවත් මහ නකත වනුයෙන් මහ > මා වෙයි. (මහතොට > මාතොට යනු ද විමසන්න.)

(ස. මාඝ)

11 **පුවපල්**

එකොළොස් වැන්න යි. සිකුරු හිමි දෙ වැන්න යි. සක්වළ මහ බලවතා වන රවි හිමි උතුරුපල් නකතට පෙරින් (පුව) පිපුණේ (පුල්) පුවපුල් යැ. පුවපුල් මැ පුවපල් වෙයි. (මුලපොත > මලපොත, බුදදා > බදාදා ඈ විමසන්න)

(ස. පූර්ව ඵාල්ගුණ)

12 **උතුරුපල්**

දොළොස් වන නකත යි. රවි හිමි දෙ වැන්න යි. පුවපලින් උතුරාගිය නකත යි. උසස් වැ තරනුයේ - තරනය කරනුයේ උ + තරු > උතුරු යි. උතුරාගිය පල් උතුරුපල් යැ.

(ස. උත්තර ඵාල්ගුණ)

13 **හත**

තෙළෙස් වන හෙවත් දහතුන් වන නකත යි. දෙ වන නැව්යෙහි (නවයේ ගොඩෙහි) සඳු හිමි දෙ වන නකත යි. දෙකයි දෙකයි හතර යි. දෙක දෙකින් වැඩි කිරීමෙන් ද හතර ලැබේ. හතර හක (සංක්ෂේප) වීමෙන් හත වේ.

(ස. හස්ත)

14 **සිත**

තුදුස් වන හෙවත් දා හතර වන නකත යි. කුජ හිමි දෙ වන නකත යි. අවමඟුල් කුජ මඟුල් යැ යි නම් කැරුණු නියරින් මැ ඔහු ගේ මුල් නකත සිවමුර (මුවසිර) කළා සේ මෙ ද සුව (යහපත) අත (පෙදෙස) යැ යි ගෙනැ සුවත > සිවත > සිත යැ යි නම් කැරිණි.

15 **සා**

සත් විසි නකතේ දෙ වන නැව්යෙහි ස වන නකත යි. පළමු වන නැව්යෙහි (රාහු හිමි) ස වැන්න සය > සා වියැ (ජයසිංහ > ජාසිංහ, තවම > තාම ආදිය ද සසඳන්නා.

(ස. ස්වාති)

16 **විසා**

සොළොස් වැන්න යි. ගුරු හිමි දෙ වැන්න යි. සා නැකැතින් විසෙස් (විශේෂ) වූයේ වි + සා > විසා යි.
( 'වි' යනු වෙසෙසි අරුතේ උපසග යි.)

(ස. විශාඛ)

17 **අනුර**

සතළොස් වන නකත යි. සැනි හිමි දෙ වැන්න යි. ගුරු හිමි විසා නැකැතින් අනු (පසු) බව ඇත්තේ (අනුව වැටෙනුයේ) අනු + ර > අනුර යි. මෙහි 'ර' යනු ඇති අරුතෙහි පසෙකි (ප්‍රත්‍යයයෙකි).

(ස. අනුරාධ)

18 **දෙට**

සත් විසි නැකැතින් දහඅට වැන්න ද බුද හිමි දෙ වැන්න ද වේ. දහ අට > දහට > දට > දෙට වෙයි. දහට දට වූයේ රදදු > රදු වූ තන්හි මෙන් මැදකුර හැලියැමෙනි.

(ස. ජ්‍යෙෂ්ඨ)

19 **මුල**

දහනව වන නකත ද කේතු හිමි දෙ වැන්න ද වේ. තුන් වන නැවියෙහි මුල මැ නකත ද මේ යැ. මේ මුල් බව නිසා මුල නම යෙදිණි.

(ස. මූල)

## 20 **පුවසළ**

විසි වන නකත ද සිකුරු හිමි තෙ වැන්න ද වේ. එක් විසි වන උතුරුසළ නකතට පුව වැ(පෙරින්, පූර්වයෙන්) අසළ (ආශ්‍රිත) බැවින් පුව + අසල > පුවසළ වේ.
(ස. පූර්වෂාඪ)

## 21 **උතුරුසළ**

එක් විසි වන නකත යි. රවි හිමි තෙ වැන්න යි. පුවසළින් උතුරාගිය හෙවත් උතුරු වැ අසළ (ආශ්‍රිත) හෙයින් උතුරු + අසළ > උතුරුසළ වේ.

(ස. උත්තරෂාඪ)

## 22 **සුවන**

දෙ විසි වන නකත ද සඳු හිමි තෙ වැන්න ද වේ. තෙ වන නැවියෙහි සිවු වන නකත හෙයින් සුවන නම්. සිවු + වන > සූවන > සුවන.

(ස. ශ්‍රවණ)

## 23 **දෙනට**

සත් විසි නැකැතින් තෙ විසි වැන්න යි. තුන් වන නැවියෙහි කුජ හිමි තෙ වැන්න යි. මෙ සේ තෙ වරක් තෙ වන තැනට එනුයෙන් තෙ + න + ට > තෙනට වෙයි.'ත' හට 'ද' වීමෙන් තෙනට > දෙනට වේ.

(ස. ධනිෂ්ට)

## 24 සියාවස

සු විසි වැන්න යි. රාහු හිමි තෙ වැන්න යි. රාහු ගේ - හිස පමණක් ඇති ග්‍රහයා (හිසා) ගේ වාසය (වස) වන හෙයින් හිසාවස නම්. එ මැ අකුරු පෙරැළියෙන් සිහාවස වේ. 'හ' හට 'ය' වීමෙන් සියාවස වෙයි.

(ස. හතභිෂග්)

## 25 පුවපුටුප

පස් විසි වැන්න යි. ගුරු හිමි තෙ වන නකත යි. ඊ ළඟැ නකත වන උතුරුපුටුපයට පුවින් (පූර්වයෙන්) සිටුනා පුටුපය හෙයින් පුවපුටුප වෙයි. මෙහි පුට නම් පුටයක් හෙවත් වටයක් මෙන් සිටුනා තරු කෙත යි.

(ස. පූර්වභද්‍රපාද)

## 26 උතුරුපුටුප

ස විසි වැන්න යි. සනි හිමි තෙ වන නකත යි. පුවපුටුපයෙන් උතුරා ගිය පුටුපය බැවින් උතුරුපුටුප වෙයි.

(ස. උත්තරභද්‍රපාද)

## 27 රේවතී

නකත් තරු විස හතෙහි අග මැ එක යි. තෙ වන නැවියෙහි ද අග මැ එක යි. බුද හිමි තෙ වැන්න යි. වසරක් පාසා කොග්ගලින් අවුරුදු පුරන හිරු අවසණුට සිටුනා අත් (අන්ත) නකත හෙයින් රිවි + අත > රේවත වෙයි.

(ස. රේවතී)

## ඇසුරු කළ පොත්පත්


### සිංහල

1. **අරුත නිරුත,** අරිසෙන් අහුබුදු, සදීපා ප්‍රකාශකයෝ, බොරැල්ල. 2000
2. **ඩේවි දුටු ලංකාව** (An Account of the Interior of Ceylon and of its Inhabitants with Trvels in that Island), ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2002
3. **මහාවංසය,** හික්කඩුවේ සුමංගල හිමි-බටුවන්තුඩාවේ පෙරැළිය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ, 1996
4. **සැරය,** වෙල්ලාල ජයමහ (සකසු), හේළි පහරුව, උණවටුන, 2496
5. **සිංහල මහිමය,** ඇම්. එච්. පීටර් සිල්වා, ගුණසිරි ප්‍රකාශකයෝ, කොළඹ, 1963
6. හෙළ දෙරණ වග, අරිසෙන් අහුබුදු, ස්ටැම්පර්ඩ් ලේක්, පන්නිපිටිය, 2005

### ඉංග්‍රීසි

7. An Historical Relation of Ceylon,(Robert Knox), Richard Chiswell, James Maclehose and Sons, London, 1911

### සදකොසු (ශබ්දකෝෂ)

8. සිංහල ශබ්ද කෝෂය, 21 වන භාගය හා 32 වන භාගය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1984
9. An Etymological Glossary of Sinhalese Language, Wilhelm Geiger, Asian Educational Service, New Delhi, Madras, 1997

### පුවත් පත්


දිවයින (දින පතා), 2004.04.12

එ මැ (ඉරිදා සංග්‍රහය) 2005.04.10


ආදි හෙළයන් නම් කළ ගොන් රැස.

අරුත් නොදත් විදෙස් නකත් ඇදුරන්

මකර යැයි සංකේතවත් කොට ඇති අයුරු








සිත්තර ඇසින් දෙ කැටියෙකින්


ආදි හෙළයන් නම් කළ මිතුන රැස අරුත නොදත් දඹදිව නකත් ඇඳුරන් මිටුන යැයි සංකේතවත් කොට ඇති අයුරු.








සිත්තර ඇසින් ළදු අඳුරෙකින්




# සිව රජු ගේ අහස් තල බෙදුම

(ක්‍රි.පෙ. 10977 - 10903)



අරිසෙන් අහුබුදු සූරීන් දිගු කලක් තිස්සේ ලියූ අවුරුදු ලිපි නන් පුවත් පත්හි පළ විය. එහෙත් ඒ ලිපි එදිනෙදා පමණ යි.

අවුරුදු වග පොතක් ලෙස රටට දීම තිරසර දෑ මෙහෙවරෙකි.

අවුරුදු වග පොතක් කළ මැනැව යි යන ඇරියුම අහුබුදු සූරීන් වෙත මා ඉදිරිපත් කෙළේ ද අවුරුදු වග පොතක් ලෙස රටට දීමට මා මෙහෙයැවුණේ ද දැයේ තිරසර මෙහෙවර සඳහා මැ යි.

'හෙළ අවුරුදු වග' ඉංගිරිසියට ද හැරැවිණි නම් හෙළ යසසට ලොව ද කුඩා වන බව මගේ නොවක් හැඟුම යි.

**වෛද්‍යාචාර්ය ජයනාත් අබේවික්‍රම**



'හෙළ අවුරුදු වග' මෙ සේ රටට දීමෙන් වෙදැදුරු ජයනාත් අබේවික්‍රමයන් කරන්නේ මහ පින්කමෙකි. පින්කම්හි මැ බැහැවුණු සිතැති, බස - රැස - දෙස - ළෙහි ලා මැ සලකන ඔවුන් වැන්නෝ ලොවැ දුලබ යි. වෙද සත් දැනුමෙනුදු පිරිපුන් වැ පැරැණි ඉසිවර වෙස් පළ කරන ඔවුන් බඳු තුරුණුවෝ යම් රටෙකැ වෙත් නම් එ රට සැබැවින් මැ වාසනාවත් යැ.

**අරිසෙන් අහුබුදු**

ISBN-955-1404-02-4

මිල: රු. 100/-

Polite Printers: 2518697